**ශීර්ෂය 291 වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 291 - වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 ජූනි 13 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූලි 05 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) දේපළ පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මඩකලපුව හා හම්බන්තොට ප්‍රදේශීය ඉංජිනේරු කාර්යාල පිහිටි ඉඩම් තක්සේරු කර එම වටිනාකම් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම ඉඩම් තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තු වෙත 2021 සිට 2023 දක්වා ඉල්ලීම් කළද මෙතෙක් ප්‍රතිචාරයක් ලැබී නොමැත. | ඉඩම් තක්සේරු කර එම වටිනාකම් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | අයිතිය දෙපාර්තමේන්තුව සතු නොවූ හෙක්ටයාර 0.7941 ක් වූ ඉඩම් 03ක් රු.42,007,000 කට තක්සේරු කර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයෙහි මූල්‍ය නොවන වත්කම් යටතේ දක්වා තිබුණි | අයිතිය දෙපාර්තමේන්තුවට පවරා ගැනීමට කටයුතු කරමින් පවතී | අයිතිය දෙපාර්තමේන්තුව සතු වත්කම් පමණක් ගිණුම්ගත කළ යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂය අවසානයට දෙපාර්තමේන්තුවට හිමි යතුරුපැදි 08 ක වටිනාකම තක්සේරු කර ගිණුම් ගත කිරීමට කටයුතු කර නොතිබුණි. තවද, ගොඩවාය නිවාඩු නිකේතනයේ යතුරුපැදියක් රු.15,000 ක් වශයෙන් හා රු.40,000 ක් වශයෙන් දෙවරක් ගිණුම්ගත කර තිබුණි. | යතුරුපැදි කිහිපයක් පමණක් ධාවන තත්ත්වයේ ඇති අතර සියළුම යතුරුපැදි ඉදිරියේදී තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ඇත. | සියළුම යතුරුපැදි තක්සේරු කර නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) | ව්‍යාපෘති කාර්යයන් සඳහා මොරටුව හා මීගමුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලවලට ලබාදී ඇති යන්ත්‍රෝපකරණ 04ක වටිනාකම තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම් ගත කර නොතිබුණි. | මෙම යන්ත්‍ර 04 න් 03ක් මේ වනවිට සේවයෙන් ඉවත්කර ඇත. Komatsu WA200 Loader - Galle යන්ත්‍රය පමණක් සේවයේ යොදවා ඇත. | සේවයේ යොදවන යන්ත්‍ර තක්සේරුකර ගිණුම්ගත කිරීමටත්, සේවයෙන් ඉවත්කර ඇති යන්ත්‍ර අලුත්වැඩියා කිරීමට හෝ අපහරණ ක්‍රියාවලිය සඳහා යොමුකිරීමට කටයුතු කළ යුතුය. |

**(ආ) අග්‍රිම ශේෂය**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් අනුව, අනෙකුත් ශීර්ෂ වෙනුවෙන් වාර්ථාකරණ ආයතනය විසින් එකතු කරන ලද ආදායම් රු.59,195,935 ක් හා දරන ලද වියදම් රු.2,708,221 ක් වුවද, එම ශේෂයන් අග්‍රිම ගැලපුම් ප්‍රකාශනයෙහි පිළිවෙලින් රු.42,932,026 ක් හා රු.2,182,012ක් වශයෙන් දක්වා තිබුණි. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ශේෂයට අනුව අග්‍රිම ගැලපුම් ප්‍රකාශය සකස් කිරීමේ දී සියළුම හරස් සටහන් මඟින් කෙරුණු ගනුදෙනු ඉවත්කොට සත්‍ය ලෙස භාණ්ඩාගාර අග්‍රිම හැර ලැබුණු අනෙකුත් ලැබීම් හා දෙපාර්තමේන්තු ගෙවීම් නොවන දෙපාර්තමේන්තු අක්මුදල් මඟින් ගෙවන අනෙකුත් ගෙවීම් ගැලපීම මඟින් ශේෂය ලබාගෙන ඇත. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව නිවැරදි අගයන් දැක්විය යුතුය. |
| (ii) | අග්‍රිම ගැලපුම් ප්‍රකාශයට නොගැලපිය යුතු තැන්පතු ගිණුම් ලැබීම් හා ගෙවීම් (හරස් සටහන්) පිළිවෙලින් රු.8,859,698 ක් හා රු.1,014,366 ක් සහ වාර්තාකරණ ආයතනය විසින් චෙක්පත් අවලංගු කර වැය විෂයයන්ට අධිභාර කිරීම් රු.316,520 ක් අග්‍රිම ගැලපුම් ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි. | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ශේෂයට අනුව අග්‍රිම ගැලපුම් ප්‍රකාශය සකස් කිරීමේ දී සියළුම හරස් සටහන් මඟින් කෙරුණු ගනුදෙනු ඉවත්කොට සත්‍ය ලෙස භාණ්ඩාගාර අග්‍රිම හැර ලැබුණු අනෙකුත් ලැබීම් හා දෙපාර්තමේන්තු ගෙවීම් නොවන දෙපාර්තමේන්තු අක්මුදල් මඟින් ගෙවන අනෙකුත් ගෙවීම් ගැලපීම මඟින් ශේෂය ලබාගෙන ඇත. | භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව නිවැරදි අගයන් දැක්විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලංකා මිනරල් සැන්ඩ් ලිමිටඩ් ආයතනය වෙත 2007 වර්ෂයේ සිට 2020 සැප්තැම්බර් 03 දක්වා කාලපරිච්ඡේදය තුළ ලබා දුන් බලපත්‍ර 04 කට හා 2020 සැප්තැම්බර් 07 සිට 2021 සැප්තැම්බර් 06 දක්වා කාලයට නිකුත් කරන ලද බලපත්‍රය මත අනුමත කළ වැලි කියුබ් ප්‍රමාණය ඉක්මවා වැඩිපුර සිදුකළ කැණීම් සඳහා අයවිය යුතු පිළිවෙලින් රු.72,895,000 ක හා රු.1,688,515 ක ගාස්තුව අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි. නමුත් ලංකා මිනරල් සැන්ඩ් ලිමිටඩ් ආයතනය විසින් රු.64,056,000 ක් පමණක් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු ලෙස ගණනය කර එම මුදල වර්ෂ 5 ක් තුළ ගෙවීම් කරන බව දන්වා තිබීම විගණනයට ගැටළු සහගත විය. | මෙම විචලතාවය දන්වා ඇති අතර ගෙවිය යුතු ඉතිරි මුදල ගෙවීමට කටයුතු කරන ලෙස ලිපියක් යොමුකර ඇත. | රජයට අය විය යුතු නිවැරදි ගාස්තුව කඩිනමින් අයකර ගැනීමට අවශ්‍ය නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |

**2.2 බැරකම් හා බැදීම්වලට එළඹීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 94(1) ට පටහැනිව 2023 දෙසැම්බර් 31 දිනට වැය විෂයයන් 04 ක රු.10,948 ක්වූ ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවා රු.5,582,213 ක බැරකම් ඇතිකරගෙන තිබුණි. | ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම, අතිරේක ප්‍රතිපාදන සලසාගැනීමට නොහැකිවීම, අත්‍යාවශ්‍ය වියදම් වීම හා හදිසි වෙරළ වැඩබිම් සඳහා කම්කරුවන් යෙදවීම, අනවසර ඉදිකිරීම් කඩා ඉවත්කිරීම් කිහිපයක් වර්ෂය තුළ සිදුකිරීම, ගමන් වියදම් පාලනය කළ නොහැකි මට්ටමකින් වැඩිවීමෙන් 2024 වර්ෂයේදී ගෙවීමට සිදුවිය. | රෙගුලිසි ප්‍රකාරව වියදම් පාලනය කර ගැනීමටත් ඉතිරිය ඉක්මවා බැරකම් ඇතිකර නොගැනීමටත් කටයුතු කළ යුතුය. |

**2.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | දෙපාර්තමේන්තුවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණු නමුත් දෙපාර්තමේන්තුවේ ගණන්දීමේ නිලධාරී විසින් ඉදිරිපත් කළ එම සමාලෝචනයන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් "2022.08.08 දිනැති අංක DMA – 02/2022 (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛ අනුව එය අවලංගු කර ඇති බව දන්වා" සහතික නොකර ආපසු එවා තිබුණි | රජයේ විගණන අංශය හා දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් පෙන්වා දෙනු ලබන විගණන නිරීක්ෂණ සැලකිල්ලට ගනිමින් ඒවා නිවැරදි කර ගැනීමට කටයුතු කර ඇති බව දන්වමි. | ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 214 | - | අවශ්‍ය විස්තරාත්මක තොරතුරු ඇතුළත් කරමින් බැදීම් හා බැරකම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | සියළුම ගෙවීම් සඳහා බැදීම් හා බැරකම් ITMIS පද්ධතියට ඇතුළත් කරන අතර, අවශ්‍ය පරිදි මුද්‍රිත සටහනක් ලබාගැනීමේ හැකියාවක් ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ලේඛනයක් පවත්වාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) | 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ට අදාළ 2020 මාර්තු 25 දිනැති අංක 35 දරන අතිරේකය | රු.මිලියන .35 | ඇස්තමේන්තුගත වියදම පිළිවෙලින් රු.මි. 17 ක් හා රු.මි. 18 ක් වූ මොරටුව ලුනාව සහ කළුතර වෙරළ තීරයන්හි රිවට්මන්ට් බැම් ඉදිකිරීමට අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ කළුගල් මිලදී ගැනීම, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවක් හරහා සිදුකරගත යුතු වුවද එය දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවක් හරහා සිදුකර කරගෙන තිබුණි. | දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව අධ්‍යක්ෂ ජනරාල්ගේ පූර්ව අනුමැතිය මත සීමිත තරඟකාරී ලංසු ක්‍රමය භාවිතා කරමින් ද්‍රව්‍ය සඳහා මිල ගණන් කැඳවීම සිදුකර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | - | දෙපාර්තමේන්තුවේ වාහන 28 ක් හා යන්ත්‍ර 18 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | ඉදිරියේ දී ඉන්ධන පරීක්ෂාවන් විධිමත්ව කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iv) | 2001/අගෝස්තු 22 දිනැති 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | වර්ෂ 05ක් ඉක්මවා එකම සේවා ස්ථානයක සේවය කර ඇති නිලධාරීන් ස්ථාන මාරුවීමවලට යටත් විය යුතු වුවද, ඒකාබද්ධ | සෑම වර්ෂයකම වසර 05 කට වඩා සේවය කරන නිලධාරීන්ගේ ලැයිස්තුවක් රාජ්‍ය පරිපාලන, ස්වදේශ | රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සමග සම්බන්ධික |

| | | |
|---|---|---|
| සේවයේ තනතුරු 04කට අයත් සේවකයින් 53 දෙනෙකු වර්ෂ 5 ක සිට වසර 15ක්ද සේවකයින් 37 දෙනෙක් වසර 15 ට වැඩි කාලයක් ද වාර්ෂික ස්ථාන මාරුවීම් නොලබා දෙපාර්තමේන්තුව තුල සේවය කරමින් තිබුණි. | කටයුතු අමාත්‍යාංශය වෙත යවා ඇතත් ස්ථාන මාරුවීම් සිදුකර නොමැත. | රණය වී දිගු කාලයක සිට දෙපාර්තමේන්තුවේ සේවය කල නිලධාරීන් සඳහා ස්ථාන මාරුවීම් ලබාදීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1981 අංක 57 දරන වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ පනතේ 7 (ඉ) හා 12 වගන්ති සහ 2018 වසරේ උපදේශක සභාව විසින් අනුමත කරන ලද වෙරළ කළමනාකරණ සංශෝධිත සැලැස්මේ 6.4.6 ඡේදය ප්‍රකාරව මහජනතාවට අවශ්‍ය කරන පොදු සංවර්ධන කටයුත්තක් සඳහා පමණක් වෙරළ රක්ෂිතයන් (පසසිටුවන්) නිදහස් කිරීම වෙරළ සංරක්ෂණ හා වෙරළ කළමනාකරණ උපදේශක සභාවේ නිර්දේශ මත දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට අනුමත කළ හැකි වුවද. 2021 දෙසැම්බර් සිට 2023 ඔක්තෝබර් දක්වා කාලය තුළ පෞද්ගලික අයදුම්පත් 81 කට ඉදිකිරීම් බලපත්‍ර ලබා දී තිබීමෙන් වෙරළ කලාපයට සිදුවන අහිතකර බලපෑම් වැළැක්වීම හෝ අවම කිරීම යන අරමුණ ඉටුවී නොතිබුණි. | සංවර්ධන කාර්ය සඳහා වෙනත් විකල්පයක් නොමැති අවස්ථාවලදී සාධාරණ කරුණු සැලකිල්ලට ගනිමින් වෙරළ කලාපයට සිදුවන අහිතකර බලපෑම අවම කරමින් උපදේසක සභාව වෙරළ කලාපයේ සංවර්ධන කාර්යයන් සඳහා නිර්දේශ ලබාදීම සිදුකරනු ලබයි. | පනතේ වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| | විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය තුළ හඳුනා ගන්නා ලද අනවසර ඉදිකිරීම් 2,763 කින් 2445 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අනවසර ඉදිකිරීම් නියමිත පරිදි කඩා ඉවත් කිරීමට කටයුතු කරන අතර, වෙරළ මත සහ අධි රක්ෂිත කලාපයේ ඒවා කඩිනමින් ඉවත් කිරීමට ද බලපත්‍ර ලබාදීමට ඇති සීමාවේ ඇති ඉදිකිරීම් සඳහා අවසර ලබා දීමට ද යොමු කර ඇත. | නිසි සැලසුම්ගත වැඩපිළිවෙලක් ඔස්සේ අනවසර ඉදිකිරීම් ප්‍රමාදයකින් තොරව ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2015 සිට 2023 දක්වා කඩා ඉවත් කිරීම් නියෝග නිකුත් කර තිබූ අනවසර ඉදිකිරීම් වෙනුවෙන් දෙපාර්තමේන්තුවට අයවිය යුතුව තිබුණු රු.3,853,006 කින් සියයට 85 ක් වන රු 3,280,780 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ලිපිනයන් හි නොමැති අයගෙන් මුදල් අය කර ගැනීම ගැටලුකාරී වී ඇත. මෙම වියදම් අය කර ගැනීම සඳහා නීති අංශය මඟින් අවශ්‍ය ක්‍රියාමාර්ග සැලසුම්කරමින් පවතී. | දෙපාර්තමේන්තුවට අයවිය යුතුව තිබෙන මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

### 3.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාර්ගගත ක්‍රමය ඔස්සේ බලපත්‍ර ලබාදීම 2019 පෙබරවාරි 22 වන දින සිට ආරම්භ කර තිබූ නමුත් එම පද්ධතියේ විවිධ දෝෂයන් පැවතීම, පද්ධතියෙන් බැහැරව අතින් බලපත්‍ර නිකුත් කිරීම, ස්ථානීය පරීක්ෂාවන් සිදුකිරීමට සැලකිය යුතු කාලයක් ගත වී තිබීම, තීරණ ගැනීමේ දී මුහුදු සීමාව හා ඉදිකිරීම සිදුකරනු ලබන දුර මාර්ගගත තොරතුරු පද්ධතිය හරහා ලබා ගත නොහැකි වීම යන කරුණු හේතුවෙන් පද්ධතිය ස්ථාපිත කිරීමෙන් අපේක්ෂිත බලපත්‍ර නිකුත් කිරීමේ කාලය අඩු කිරීම යන අරමුණ ඉටුවී නොතිබුණි. | මුහුදු සීමාවේ සිට දුර ලබා ගැනීමේ නිරවද්‍යතාවය 100% තහවුරු කළ නොහැකි බැවින් එය මාර්ගගත පද්ධතිය තුළින් ලබා ගැනීමට කටයුතු සිදු නොකරයි. | පවතින ගැටළු විසදා මාර්ගගත තොරතුරු පද්ධතිය වැඩිදියුණු කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |
| (ආ) | 2017 වර්ෂයේදී ඇතිවූ ගංවතුර තත්ත්වය පාලනය සඳහා පිළියමක් ලෙස කළුගඟ ගංමෝය කට පුලුල් කිරීම නිසා කළුතර අවට වෙරළ ඛාදනය දැඩි ගැටලුවක් බවට පත්ව ඇති අතර එම වෙරළ ඛාදනය නැවැත්වීමට පිළියමක් ලෙස 2017 වර්ෂයේ සිට 2023 දෙසැම්බර් 31 දක්වා රු.මි. 189 ක් වැයකර ව්‍යාපෘති කාර්යන් 19 ක් සිදුකර තිබුණ ද ගැටලුව සඳහා ස්ථිර පිළියමක් ලැබී නොතිබුණි. | කළු ගඟ මුවදොර කැලිඩෝ වැලි වැටිය සම්පූර්ණයෙන් සේදී යාමෙන් අනතුරුව එය ස්වභාවිකව පෙර තිබූ තත්ත්වයට පත් කිරීම සඳහා අප විසින් ඉදිරිපත් කරන ලද සැලැස්ම කළුතර ගංවතුර පාලනයට බාධාවක් විය හැකි බවට කළුතර දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීමේදී පාර්ශවකාර ආයතන විරෝධතාවය දැක්වීම හේතුවෙන් 2023 වර්ෂයේදී අත්හිටුවන ලදී. | වැයකරන ලද රු.මි. 189 ක මුදල ඵලදායි වන ලෙස ස්ථිර පිළියමක් යෙදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සම්බන්ධිත ආයතන සමග සම්බන්ධීකරණයෙන් ක්‍රියාත්මක කළ යුතුය. |

### 3.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කළුතර කැලිඩෝ වෙරළ තීරයේ වෙරළ ඛාදනය හා ඒ අසල ඇති මාර්ගය වෙත වැලි පිරීම වැලැක්වීම සඳහා රිවට්මන්ට් බැම්මක් ඉදිකිරීමට අවශ්‍ය ටොන් 20 එස්කැවේටර් යන්ත්‍රය යන්ත්‍ර පැය 650 ක් සහ කියුබ් 01 ලෝඩර් යන්ත්‍රය යන්ත්‍ර පැය 300 ක සේවාව සපයා ගැනීම පිණිස 2021 වර්ෂය අවසානයේ ගිවිසුම්ගත වූ සැපයුම්කරුවන් වෙත පිළිවෙලින් යන්ත්‍ර පැය 213.5 ක් සඳහා රු.1,184,925 ක් හා යන්ත්‍ර පැය 49.3 ක් සඳහා රු.322,915 ක් ගෙවා තිබූ නමුත් ඊට අදාළව සිදුකළ කාර්යයන් විගණනයේ දී සනාථ නොවුණු අතර වැඩබිමේ කටයුතු නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම නිසා නිලධාරීන්ගේ අවසරය ඇතිව සැපයුම්කරුවන් කාර්යය අතරමඟ නවතා වැඩබිමෙන් යන්ත්‍ර ඉවත්කරගෙන තිබුණි. ඒ අනුව වැඩබිමේ ඉතිරි වැඩ සඳහා ලෝඩර් යන්ත්‍රය, එස්කැවේටර් යන්ත්‍රය හා ටිපර් රථ සේවා වෙනුවෙන් 2023 වර්ෂයේ දී ඇස්තමේන්තුව කළ මිල ගනන් 2021 ඇස්තමේන්තුවට වඩා රු.1,814,790 කින් වැඩිවී තිබුණි. එසේ මිල ගණන් කැඳවීමෙන් ලබාගත් එස්කැවේටර් යන්ත්‍රය නිතර අක්‍රීය වීම හේතුවෙන් අනෙකුත් යන්ත්‍ර භාවිතා කිරීමට නොහැකි වීම මත 2023 ජූලි සිට අගෝස්තු 11 දින දක්වා අක්‍රීය කාලය සඳහා ද රු.1,756,280 ක් ගෙවීමට සිදුවී තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද වැඩබිමේ කටයුතු අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | වැඩබිම ආසන්නව වැලි ගොඩ ගැසීම සහ මූලික වැඩ කටයුතු සිදු කිරීම සඳහා යන්ත්‍ර පැය වැය වී ඇත. රටේ පැවති ආර්ථික අර්බුදය හේතුවෙන් මිල ගණන් අධික ලෙස ඉහළ යාම නිසා සංශෝධිත ඇස්තමේන්තුවේ මිල ගණන් වැඩිවී ඇත.යන්ත්‍ර සැපයුම්කරුගේ දෝෂ නොවන හේතු සහ දෙපාර්තමේන්තු සැපයුම් ප්‍රමාදයක් හෝ යන්ත්‍ර අලුත්වැඩියාවක් වැනි වෙනත් කරුණක් නිසාවෙන් අනෙකුත් යන්ත්‍ර නිෂ්කාර්ය වීමේදී එම අක්‍රීය කාලයන් සඳහා අවම පැය ගණන ගෙවිය යුතු වේ. | නිසි සැලැස්මකින් හා අධීක්ෂණයකින් යුතුව හා අරපිරිමැසුම්දායීව වැඩබිමේ කටයුතු සිදුකර අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීමට පියවර ගත යුතුය. |

### 3.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල සහ නිවාඩු නිකේතනවලට අනුයුක්ත කර තිබූ | රථ 03 ක අළුත්වැඩියාව සඳහා ඇස්තමේන්තු කැඳවා ඇති අතර, එක් රථයක | 2022 ජනවාරි 25 දිනැති අංක 04/2022 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ |

| | | | |
|---|---|---|---|
| | වාහන 11ක් අලුත්වැඩියා හා සුලු දෝෂ තත්ත්වයන් මත වර්ෂ 2 කට ආසන්න කාලයක් ධාවනයෙන් ඉවත් කර තිබුණි. | අළුත්වැඩියාව අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතියට යොමුකර ඇත. | විධිවිධාන සම්බන්ධයෙන් නිසි අවධානය යොමු කර වාහන අලුත්වැඩියා කර ධාවන තත්වයට පත්කර ගැනීමට හෝ ධාවනයට නුසුදුසු නම් අපහරණ ක්‍රියාවලිය සඳහා යොමුකිරීමට හෝ කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 16 වන දින වෙරළ සංරක්ෂණ හා පහත්බිම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය වෙත භාර දී තිබුණු රු.5,800,000 ක් වටිනා ඩබල් කැබ් රථයේ අයිතිය පැවරීමට හෝ එම වාහනය දෙපාර්තමේන්තුව වෙත නැවත ලබා ගැනීමට හෝ සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් කටයුතු කර නොතිබුණි. | මෙම රථයේ අයිතිය පැවරීමට අවශ්‍ය ආකෘති පත්‍ර පුරවා ලබාදී ඇති අතර 2023.10.06 දින මේ සම්බන්ධව විමසා ලිපියක් යොමු කර ඇත. | 2017 දෙසැම්බර් 21 දිනැති අංක 02/2017 දරන චක්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව වාහනයේ අයිතිය පැවරීමට හෝ දෙපාර්තමේන්තුව වෙත නැවත ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙරළ කලාපයන් තුළ සිදුකරනු ලබන ඉදිකිරීම් සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ බලපත්‍ර ලබාදීම පිණිස රු.5,000,000 කට පද්ධතියක් සකස්කර ගැනීම සඳහා 2016 ජූනි 09 දින ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණ ද, පසුව එම ආයතනය විසින් එම කාර්යය රු.14,528,000 කට පෞද්ගලික පාර්ශවයකට පැවරීම නිසා රු.9,528,000 ක් වැඩිපුර ගෙවීමට සිදුවී තිබුණි | මෙම කාර්ය රු. මිලියන 5 කට සිදු කිරීමට එළඹුන කතාවය මත ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ආයතනය සමඟ අවබෝධතා ගිවිසුමකට එලඹෙන ලදී. කෙසේ වුවද එම ආයතන විසින් සියලු ප්‍රසම්පාදන කාර්යයන් සිදුකර රු.14,528,000 ක අවම මිල ගණන් ඉදිරිපත් කළ පෞද්ගලික සමාගමක් තෝරා ගන්නා ලදී. | ප්‍රසම්පාදනයේදි ඇස්තමේන්තුව නිවැරදිව තක්සේරු කළ යුතු අතර ගිවිසුම් ගත වටිනාකමට සේවාව සැපයීමට අපොහොසත් වේ නම් අදාල කොන්ත්‍රාත්තුව අවලංගු කර නැවත ප්‍රසම්පදන ක්‍රියාවලිය පිලිපැද සුදුසු සැපයුම්කරුවකු තෝරා ගත යුතු ය. |

### 3.7 අනාර්ථික ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) යන්ත්‍ර අලුත්වැඩියා වියදම් | | |
| 2023 වර්ෂයේදි රු.3,183,897 ක් ගෙවා අළුත්වැඩියා කර තිබූ එක්ස්කැවේටර් යන්ත්‍ර 3 සමාලෝචිත වර්ෂය අවසානය වන විටද අක්‍රිය තත්ත්වයේම පැවතුණු අතර ව්‍යාපෘතීන් සඳහා අවශ්‍ය යන්ත්‍ර කුලියට ගෙන තිබුණි. තවද ඉන් එක් එක්ස්කැවේටර් යන්ත්‍රයක ඉන්ධන දහනය පිළිබඳ පරීක්ෂාවක් සිදු නොකර පැයකට ලීටර් 24 ක් දහනය වන ලෙස ගණනය කර 2018 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා යන්ත්‍ර පැය 4500 ක් සඳහා ඉන්ධන තුලනය කර තිබුණි. | රජයේ වියදම් සීමාකිරීම නිසා සියළුම අළුත්වැඩියාවන් නවතා දැමීමෙන් යන්ත්‍රය තව තවත් දිරා යාමට ලක්වුණි. | අක්‍රිය යන්ත්‍ර අළුත්වැඩියා කර කාර්යක්ෂමව භාවිතයට ගැනීමටත්, ඉන්ධන දහන පරීක්ෂාවන් නිසි පරිදි සිදු කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ආ) මොරටුව ලුනාව වෙරළ තීරයේ රිවට්මන්ට් බැම්ම ඉදිකිරීමේ ව්‍යාපෘතිය | | |
| (i) මොරටුව ලුනාව වෙරළ ඛාදනය වැළැක්වීම පිණිස මීටර් 100 ක් පමණ දිගට ඉදිකර තිබූ රිවට්මන්ට් බැම්ම මීටර් 300 ක් දක්වා දික් කිරීම සඳහා අවශ්‍ය යන්ත්‍ර හා අමුද්‍රව්‍ය මිලදීගැනීමට 2021 වර්ෂය ආරම්භයේදී රු.24,999,825 කට ඇස්තමේන්තු කර වර්ෂය අවසානයේදී බැම්ම මීටර් 410 ක් දක්වා දික් කර ඇස්තමේන්තුව රු.36,287,012 ක් දක්වා වැඩිකර තිබුණු අතර මෙම බැම්ම දික් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සනාථ නොවුණි. | පිළිතුරු ලබා දී නොමැත | කොන්ත්‍රාත්තු පිරිනැමීමේ දී රටේ ආර්ථික හා මූල්‍ය ස්ථාවරත්වය සැලකිල්ලට ගෙන සංවර්ධන කටයුතු වල අවශ්‍යතාවය තීරණය කළ යුතුය |
| (ii) ව්‍යාපෘතිය සඳහා 2021 අප්‍රේල් 25 දිනට පෙර අවශ්‍ය අමුද්‍රව්‍ය සැපයීමට රු.11,960,100 ක ගිවිසුම්ගත වටිනාකමකට එකගවූ සැපයුම්කරු ද්‍රව්‍ය සැපයුම අතරමග නවතා දමා තිබීම හේතුවෙන් මුල් ප්‍රසම්පාදනයෙන් නොසැපයූ කුට්ටි ගල් 4,549 ක් සපයා ගැනීමේදී දෙපාර්තමේන්තුවට රු.1,742,267 ක පාඩුවක් සිදුවී තිබුණි | සිමෙන්ති සහ පුපුරණ ද්‍රව්‍ය මිල ඉතා අධික ලෙස ඉහළ යාම හේතුවෙන් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ මිල ගණන් යටතේ තවදුරටත් ද්‍රව්‍ය සැපයුම් සිදුකළ නොහැකි බව දන්වා ඇත. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු විසින් සැපයුම්කරු ඉල්ලුම් කළ මිල ගණන් වැඩිවීම ප්‍රතික්ෂේප කර ඇත. | අනාර්ථික වියදම් වළක්වා ගැනීමට ආරම්භයේදීම විධිමත් සැලැස්මක් කෙටුම්පත් කර ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | වෙරළ ආශ්‍රිත නිවාස 38 ක් සම්බන්ධයෙන් පැවති ගැටළුකාරී තත්ත්වය සමනය කර නොගැනීම, අමුද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමට හා දුම්රිය හරස් මාර්ගයට කොඩිකරුවන් යෙදවීමට දුම්රිය දෙපාර්තමේන්තුවට රු.3,567,321 ක් ගෙවා තිබියදී දුම්රිය හරස් මාර්ගයට නිසි පරිදි කොඩිකරුවන් නොයෙදවීම හා ද්‍රව්‍ය සැපයුම් ප්‍රමාදවීම යන හේතුන් මත 2021 නොවැම්බර් 11 දින අවසන් කිරීමට සැලසුම් කර තිබූ ව්‍යාපෘතිය එදිනට අවසන් කිරීමට නොහැකිවීමෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඇස්තමේන්තුගත පිරිවැය රු.65,919,292 ක් දක්වා වැඩි වී තිබුණි. | නියමිත පරිදි වැඩබිම් ඉදිකිරීම් කටයුතු අවසන් කිරීමට නොහැකි වූ අතර නැවත ප්‍රසම්පාදනයෙන් යන්ත්‍ර හා ද්‍රව්‍ය සැපයුම් ලබාගෙන 2023 වසරේ වැඩ සැලැස්ම අනුව වැඩබිම ඉදිකිරීම් කටයුතු මේ වන විට සිදු කරමින් පවතී. | පවතින ගැටළු ආරම්භයේදීම නිරාකරණය කරගෙන ව්‍යාපෘතිය නියමිත කාලය තුල අවසන් කර අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කළයුතුයි |

## 3.8 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එක් තාක්ෂණික නිලධාරියෙකු පමණක් අනුයුක්ත කර ඇති දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික ඉංජිනේරු වැඩහල අක්‍රීය තත්ත්වයේ පැවතුණි. | තාක්ෂණික නිලධාරීන් 02ක් සේවයේ යෙදිය යුතු වුවත්, යාන්ත්‍රික අංශයට අනුයුක්තව සිටි ශිල්පීය දැනුම ඇති නිලධාරීන් කිහිප දෙනෙකුම විශ්‍රාම ලබා ඇත. රජයේ ප්‍රතිපත්තිමය තීරණ අනුව කාර්යය මණ්ඩල බඳවාගැනීම් අත්හිටුවා ඇති බැවින් පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ හැකියාවක් නොමැත. | ආයතනයේ පවතින මානව සම්පත නිසි පරිදි කළමනාකරණය කළ යුතුය. |
| (ආ) | දෙපාර්තමේන්තුවේ සේවය හැර ගිය නිලධාරින්ගෙන් අයවීමට ඇති වර්ෂ 1 ත් 3 ත් අතර කාලයකට අදාල සේවක ණය රු.303,061 ක් ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේයේ 4 ඡේදය ප්‍රකාරව 2023 දෙසැම්බර් 31 දින වනවිටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | ආපදා ණය රු.15,120 ක් අයවීමට ඇති රියදුරු නැවත සේවයේ පිහිටුවීට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලීම් කර ඇති අතර ආපදා ණය රු.156,030 ක් අයවීමට ඇති රියදුරුගේ ඇපකරු මෙතෙක් වාරික මුදල් එවා නොමැත. | ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේයේ 4 ඡේදය ප්‍රකාරව හිග ණය ශේෂ අයකරගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2021 හා 2023 වර්ෂවල සේවය හැරගොස් තිබුණු නිළධාරින් හතර දෙනෙකුට වැටුප් හා දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබුණු එකතුව රු.189,535 ක් අයකර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | රු.39,525 ක් අයවීමට ඇති රියදුරු නැවත සේවයේ පිහිටුවීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කර ඇත. අනෙක් යන්ත්‍ර ක්‍රියාක රු. රු.37,601 ක්, කාර්යාල සේවකයා රු.44,953 ක් හා ක්ෂේත්‍ර කම්කරුගෙන් රු.67,456 ක් ගෙවන ලෙස ලිපි යොමු කර ඇත. | කඩිනමින් අයකරගැනීමට කටයුතු කළ යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම**

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශගුණික ආශ්‍රිත වෙරළබඩ ආපදා වැළැක්වීම හා වෙරළබඩ පරිසර පද්ධති තිරසර ලෙස සංරක්ෂණය කිරීම යන තිරසර සංවර්ධන ඉලක්ක යටතේ බලපෑමට ලක් වූ ප්‍රදේශ හඳුනාගෙන කළමනාකරණය කිරීම මඟින් වැලි කඳු, කඩොලාන සහ ලවණ වගුර හා සංවේදී පරිසර පද්ධති හෙක්ටයර් 70ක ප්‍රමාණය සංරක්ෂණය කිරීම යන ඉලක්කගත කාර්යයේ ප්‍රගතියක් නොතිබුණි. | පසුගිය වර්ෂ කිහිපයක ප්‍රතිපාදන හිඟතාවය සහ නව ව්‍යාපෘති ආරම්භ නොකරන ලෙස දන්වන ලද චක්‍රලේඛ හේතුවෙන් මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් නොතිබුණි. ආරුගම්බේ වෙරළ තීරයේ උල්ල වැලි වැටිය සංරක්ෂණය කිරීම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරමින් පවතී. නඩුවක් හේතුවෙන් මෙම කටයුතු ප්‍රමාද වී ඇත. | සැලසුම්ගත කාර්යයන් ක්‍රියාත්මක කර ඉලක්ක කරා ලඟා විය යුතු අතර එසේ කළ නොහැකි අවස්ථාවන්වලදී සැලසුම් සංශෝධනය කර ඒ අනුව කටයුතු කළ යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරික්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ 541 ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන් 126 ක පුරප්පාඩු පැවති අතර ඊට නියෝජ්‍ය අධ්‍යක්ෂ හා සහකාර අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුගත) තනතුරු 06ක් ඇතුලුව ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 14 ක්, තෘතීය හා ද්විතික මට්ටම්වල තනතුරු 53 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 59 ක් ඇතුලත් විය. තවද, අනුමත සංවර්ධන නිලධාරී තනතුරු 90 ක් වුවද, තත්‍ය සංඛ්‍යාව 110 ක් වූයෙන් 20 ක අතිරික්තක් විය. | ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 02 ක් හා ජල විද්‍යා මිනින්දෝරු තනතුර 2023 වර්ෂයේ හා පරිපාලන නිලධාරි තනතුර 2024 වර්ෂයේ දී සම්පූර්ණ කර ඇත. නියෝජ්‍ය අධ්‍යක්ෂ හා සහකාර අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තු ගත) තනතුරු 06 ක පුරප්පාඩු සඳහා බඳවාගැනීමට අනුමැතිය ලබා ගැනීම පිණිස කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. ප්‍රාථමික මට්ටමේ තනතුරු සඳහා බහු කාර්යය කාර්යසාධන දෙපාර්තමේන්තුව මඟින් ලබාදී ඇති කණිෂ්ඨ සේවකයන් ක්ෂේත්‍ර සහකාර තනතුරු සඳහා අනුයුක්ත කර ඇත. | අවශ්‍ය අනුමැතීන් ලබාගෙන බඳවා ගැනීම් සිදු කිරීමට හෝ පවතින කාර්යමණ්ඩලය මත කටයුතු පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව සමාලෝචනය කර තනතුරු සංඛ්‍යාව සංශෝධනය කර ගැනීමට කටයුතු කළ යුතුය. |